**(අ).පසුගිය මහා සභා වාර්තාව ඉදිරිපත් කර සම්මත කර ගැනීම.**

පන්විල ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයේ vi වන සැසි වාරයේ තෙවන මහා සභා රැස්වීම මෙදින ප.ව. 01.30 ට ආරම්භ වූ අතර 2023.02.15 දින පවත්වන ලද මහා සභා රැස්වීම් වාර්තාව සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.එම්.එන් රාජපක්ෂ මැතිතුමාගේ යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.ආර්.බී වරද්දන මැතිතුමාගේ ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

**(ආ).ගරු සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.**

I. පළාත් පාලන කොමසාරිස්ගේ අංක සිපිසි/සිඑල්ජී/3/2/16-1 හා 2023.02.27 දිනැති ගරු ආණ්ඩුකාරඅනුමැතිය ලබාගැනිම සම්බන්ධ ලිපිය අනුව 2022 වර්ෂයේ සභා පොදු අරමුදල් යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බවත් එම වැඩසටහන් මැතිවරණ කොමිෂන් සභාවෙන් නිකුත් කර ඇති සියලු චක්‍රලේඛන හා උපදෙස් අනුව ක්‍රියාත්මක කරන ලෙසට දන්වා ඇති බවට ගරු මහා සභාව දැනුවත් කරන ලදි.

II. එක්සත් ජාතික පක්ෂ මහලේකම්ගේ 2023.02.22 දිනැති ලිපිය අනුව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි පී.කේ.ඩී අනුර ශාන්ත මැතිතුමා,ගරු මන්ත්‍රි සමන්ත පුෂ්පකුමාර මැතිතුමා ගරු මන්ත්‍රි එස්.එම්.එස් හාජා මොහිදීන් මැතිතුමා යන මන්ත්‍රිවරුන්ගේ එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වය අහෝසි කර ඇති බවට ගරු මහා සභාව දැනුවත් කරන ලදි.

III. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ SLIG /PP/13/CC/2023-02 හා 2023.02.23 දිනැති පරිසර ආරක්ෂණය හා ඝන අපද්‍රව්‍ය කළමණාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව පිළිබඳ ගරු මහා සභාව දැනුවත් කරන ලදි.

IV. පළාත් පාලනය පිළිබඳ ශ්‍රී ලංකා ආයතනයේ SLIG /PP/13/CC/2023-01 හා 2023.02.23 දිනැති ව්‍යාපෘති කළමණාකරණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සම්බන්ධයෙන් ගරු මහා සභාව දැනුවත් කරන ලදි.

**ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි, සන්නිවේදන ඉදිරිපත් කිරීම**

ලැබී නැත

**(ඇ).යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

ලැබී නැත

**(ඉ).යථා පරිදි කල් දී ඇති යෝජනා**

**01.(1) ගරු ප්‍රාදේශීය සභා සභාපති ඒ.ජී සෙනෙවිරත්න මැතිතුමාගේ යෝජනා**

I. 01.(1) 1. 2023 වර්ෂයේ පළාත් නඩත්තු ක්‍රියාකාරි සැලැස්ම සඳහා සංවර්ධන යෝජනා ලබා ගැනීම වෙනුවෙන් මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ලේකම්,මධ්‍යම පළාත් මාර්ග සංවර්ධන අමාත්‍යාංශය වෙත යොමු කළ යෝජනාව වන පීරිස් කඩේ අසලින් ආරම්භ වන කොස්ගම සිට බැද්දේගම පාරට යාවන මාර්ගයේ ඉතිරි කොටස් සංවර්ධනය කිරිමේ යෝජනාව මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එම්.ආර්.බී වරද්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**(ඉ) 01. .I.අදහස් ප්‍රකාශ කිරීමෙන් පසු යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

II. 87/3 මඩුල්කැලේ පාර වම පන්විල යන ස්ථානයෙහි පදිංචි ඇන්තනි ඇලෙක්සැන්ඩර් මහතා විසින් 2022.05.05 වන දින ලබාදුන් ගොඩනැගිලි සීමාව මාර්ග මධ්‍යයේ සිට 20 '(අඩි) වුවත් එම ගොඩනැගිල්ල ඉදිකිරිම සඳහා සැලසුම් සකස් කර ඇත්තේ 15'(අඩි)ක දුර සීමාව තුල බැවින් එම ගොඩනැගිල්ල ඉදි කිරිම සඳහා නිර්වන්දි ගිවිසුමකට යටත්ව අනුමැතිය ලබා දීමට මහා සභා අනුමැතියට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ඩී.ආර් උදයංගනි කරුණාරත්න මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

**(ඉ) 01. II.අදහස් ප්‍රකාශ කිරීමෙන් පසු යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

(ඉ) 01. III. පන්විල උඩ කුඹුර අංක 14 හි පදිංචි යූ.ආර් සිරියලතා මිය විසින් 2023 වර්ෂයට අදාළ වරිපනම් බද්දෙන් නිදහස් කර දෙන ලෙස 2022/12/11 දිනැතිව ඉල්ලුම් කර ඇත.ග්‍රාම නිලධාරි මහතා විසින් මේ සම්බන්ධයෙන් යොදන ලද වාර්තාව ප්‍රාදේශිය ලේකම් විසින් අනු අත්සන් කර ඇත.ඒ අනුව ආදායම් පරීක්ෂක මහතා විසින් ලබා දී ඇති වාර්තාව පරිදි අංක 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 135 (ඉ) වගන්තිය ප්‍රකාරව 2023 සඳහා පමණක් වරිපනම් බද්දෙන් නිදහස් කිරිම සඳහා මහා සභා අනුමැතියට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි ඩී.ආර් උදයංගනි කරුණාරත්න මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

**(ඉ) 01.III. අදහස් ප්‍රකාශ කිරීමෙන් පසු යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

(ඉ) 01. IV. ප්‍රාග්ධන ආයෝජන ව්‍යාපෘති 2023 වර්ෂයට අදාලව මාර්ග මැනිම සඳහා ප්‍රතිපාදන වෙන් කර ගැනීමට මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව පළාත් පාලන සහකාර කොමසාරිස් වෙත යොමු කළ ඇමුණුමෙහි සඳහන් මාර්ග ලැයිස්තුව හා දළ ඇස්තමේන්තු මුදල මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සුදන්ත පී.ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**(ඉ) 01.(IV). අදහස් ප්‍රකාශ කිරීමෙන් පසු යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

(ඉ) 01. V. ජලභීතිකා රෝග එනනත් මර්ධන වැඩසටහන සඳහා මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ට පහත පරිදි ලබාදුන් ඉන්ධන සඳහා අනුමැතිය ලබා ගැනිමට මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි..

1) කේ.එම්.ආර්.ඩී.බී දිසානායක මයා - පරිපාලන ම.සෞ.ප 10 L

2) එච්.ඒ.ආර්.කේ හපුආරච්චි මයා - ම.සෞ.ප 7 L
3) ඒ.එම්.ටී.සී.ඒ පිළිමතලව්ව මයා - ම.සෞ.ප 7 L
4) කේ.බී කපිලරත්න බංඩා මයා - ම.සෞ.ප 7 L

ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ඩබ්.එම්.ආර්.බී වරද්දන මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**(ඉ) 01.(V). අදහස් ප්‍රකාශ කිරීමෙන් පසු යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

(ඉ) 01. VI. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 2012 වැඩසටහන යටතේ සිදු කරන ලද නෙල්ලුමලේ උඩ කොටස පුද්ගලික වත්තට නාන පිහිල්ලක් ඉදිකිරිම ව්‍යාපෘතියට අදාළව කර්මාන්ත තැන්පත් ලේඛනයේ 2013 වර්ෂයේ සිට ඉදිරියට එන රු.9360.00 ක මුදල ගෙවීම සඳහා එවකට සිටි තාක්ෂණික නිලධාරි මහතා විසින් නිර්දේශ ලබා දී නොමැති බැවින් හා වර්තමානයේ ඒ පිළිබඳ පරික්ෂාවට ලක් කර එම මුදල කොන්ත්‍රාත් සමිතියට ගෙවීමට හැකියාවක් නොමැති බැවින් අදාළ රු.9360.00 ක මුදල ආදායමට ගැනීම සඳහා මහා සභා අනුමැතියට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි පී.එම්.එන් රාජපක්ෂ මැතිතුමා මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**(ඉ) 01 .( VI). අදහස් ප්‍රකාශ කිරීමෙන් පසු යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

(ඉ) 01. VII. පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන 2018 විශේෂ අවශ්‍යතා ගම්මාන සවර්ධනය කිරිම වැඩසටහන යටතේ සිදුකරන ලද ගෝමර හිඟුරු කැලේ මාර්ගය සංවර්ධනය කිරිම ව්‍යාපෘතියට අදාළව කර්මාන්ත තැන්පත් ලේඛනයේ 2019 වර්ෂයේ සිට ඉදිරියට එන රු.96717.55 ක මුදල ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත් භාරව කටයුතු කළ ගෝමරය දිලෙන තරු සමෘද්ධි ප්‍රජා මූල සමිතිය විසින් මේවන තෙක් ඉල්ලුම් කර නොමැති බැවින්ද අදාළ අතරුදවුම් මුදල ගෙවීමට එවකට සිටි තාක්ෂණික නිලධාරි මහතා විසින් නිර්දේශ ලබා දී නොමැති බැවින්ද වර්තමානයේ ඒ පිළිබඳ පරික්ෂාවකට ලක් කර එම මුදල කොන්ත්‍රාත් සමිතියට ගෙවීමට හැකියාවක් නොමැති බැවින්ද අදාළ රු.96717.55 ක මුදල ආදායමට ගැනීම සඳහා මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින්කරනලද යෝජනාව ගරුප්‍රාදේශි සභාමන්ත්‍රිනි ඩී.ආර් උදයංගනි කරුණාරත්න මැතිණිය විසින් ස්ථිර කරන ලදී.

**(ඉ) 01. ( VII). අදහස් ප්‍රකාශ කිරීමෙන් පසු යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**02.** <u>යථා පරිදි කල් නොදුන් යෝජනා</u> -

02.I. ජලහීතිකා එන්නත්කරණ වැඩසටහන සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාලයෙන් යොමු කළ 52-7514 අංක දරණ කැබ් රථයට මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව ලබාදුන් ඉන්ධන ලීටර් 40 ක ප්‍රමාණය මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.සුරේෂ් කුමාර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**(ඉ) 02.(01) I.අදහස් ප්‍රකාශ කිරීමෙන් පසු යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

02.(01).II ජලහීතිකා එන්නත්කරණය සඳහා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා කාර්යාලයේ 52-7514 අංක දරණ කැබ් රථයට ලබාදුන් ඉන්ධන ලීටර් 40 ක ප්‍රමාණයේ රු.16200.00 ක බිල්පත මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උපසභාපති එම්.සිවකුමාර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**(ඉ) 02. (01) II.අදහස් ප්‍රකාශ කිරීමෙන් පසු යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

02.III. පන්විල ප්‍රාදේශීය සභාව විසින් 2022 නොවැම්බර් මස 18 වැනි දින අංක 2307 දරණ ගැසට් පත්‍රයේ 2023 වර්ෂය සඳහා ඔප්පු උද්‍ධෘත ලියාපදිංචිය සඳහා අයකරන ගාස්තුව සංශෝධනය කිරිම සුදුසු බවටත් එමඟින් පාරිභෝගිකයින් විසින් නිවැරදි අයිතින් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරිමට අභිප්‍රේරණය වීමක් සිදුවන බවටත් ආදායම් පරික්ෂක මහතා විසින්කරුණු දක්වා ඇති බැවින් මෙහි සඳහන් සඳහන් පරිදි අදාළ ගාස්තු සංශෝධනය කිරිමට මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.

ඔප්පු උධෘත ලියාපදිංචි ගාස්තු සංශෝධනය කිරිම.

| ඔප්පුවේ වටිනාකම<br>රු. ශත | පරික්ෂා කිරිමේ ගාස්තු<br>රු. ශත | ලියාපදිංචි ගාස්තු<br>රු. ශත | මුළු එකතුව<br>රු. ශත |
|---|---|---|---|
| 01-500000.00 | 1000.00 | 1000.00 | 2000.00 |
| 500001-1000000.00 | 1500.00 | 1000.00 | 2500.00 |
| 100001-2000000.00 | 2000.00 | 1000.00 | 3000.00 |
| 200001-3000000.00 | 2500.00 | 1000.00 | 3500.00 |
| 300001-4000000.00 | 3000.00 | 1000.00 | 4000.00 |
| 4000001-5000000.00 | 3500.00 | 1000.00 | 4500.00 |
| 500001 ට වැඩි | 4000.00 | 1000.00 | 5000.00 |

ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.සිවලිංගම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**(ඉ) 02. (01) III.අදහස් ප්‍රකාශ කිරීමෙන් පසු යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

02.IV. 2022.12.21 වන දින පැවති මහා සභා රැස්වීමේ තීරණ අංක (ඉ).01.(01) .I යටතේ සභා සම්මත වු 2023 වර්ෂයේ මහා සභා රැස්වීම් පැවැත්වීමේ දින ඇතුළත් යෝජනාවේ මාර්තු මස මහා සභා රැස්වීම පැවැත්වීමේ දිනය සංශෝධනය කර ඒ වෙනුවට 2023.03.02 වන දින ප.ව 1.30 ට මහා සභා රැස්වීම පැවැත්වීමට මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.
ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා උපසභාපති එම් සිවකුමාර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**(ඉ) 02..(01).IV.අදහස් ප්‍රකාශ කිරීමෙන් පසු යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

02. V. හාතලේ කසලාංගනය අලුත්වැඩියා කිරිම සඳහා මිළදිගත් භාණ්ඩ /ද්‍රව්‍ය හා සභා අරමුදලින් ලබාදීම සඳහා ගරු මන්ත්‍රී යෝජනා අනුව තණකොළ කපන මැෂිමක් සහ අමානෝ සෙවිලි තහඩු සඳහා ගෙවිය යුතු රු.289850.00 ක බිල්පත් පහත සඳහන් ආයතන වෙත ගෙවීම සඳහා මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.
තිලකරත්න හාඩ්වෙයාර් - 215,450.00 (කසලාංගනයට - 185500.00,තණකොළ කපන මැෂිම -29950.00)
ධම්මික හාඩ්වෙයාර් - 74400.00

ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුදන්ත පී ලියනගේ මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**(ඉ) 02. (01). V.අදහස් ප්‍රකාශ කිරීමෙන් පසු යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**(ඊ) කාරක සභා වාර්තා සලකා බැලීම**

1. 2022.12.30,2023.01.11.හා 2023.01.30 යන දිනයන්හිපැවැති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තා
2. 2023.01. දින හා 2023.02.පැවැති කාර්මික සේවා කාරක සභා වාර්තා
3. 2023.01. 10 දින හා 2023.02.07 දින පැවති පරිසර හා පහසුකම් කාරක සභා වාර්තා
4. 2023.01.10 දින හා 2023.02.07 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා වාර්තා

2023 ජනවාරි හා පෙබරවාරි මස පැවති පරිසර හා පහසුකම් කාරක සභා වාර්තාවල අනවසර ඉදිකිරිම් සම්බන්ධයෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස් .සුරේෂ් කුමාර මැතිතුමා විසින් සිදු කළ ප්‍රකාශයන් ඇතුළත් වී නොමැති බවට ප්‍රකාශ කරන ලදි.
මෙහිදි ගරු සභාපතිතුමා විසින් කාරක සභා වල සභාපතිවරුන් විසින් අදාළ වාර්තා නිරික්ෂණය කර අඩුපාඩු ඇත්නම් නිවරදි කර එකි වර්තා පිළියෙළ කිරිමට කටයුතු කරන මෙන් කාරක සභා සභාපතිවරුන් දැනුවත් කරන ලදි

ඉහත කාරක සභා වාර්තා නිවැරදි බවට මහා සභාව විසින් පිළිගන්නා ලදී.

**(උ) ලැබීම් හා ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශ,එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා සහ ප්‍රාදේශීය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛණ ඉදිරිපත් කිරීම හා සලකා බැලීම.**

1. 2022.12.31 දිනට ලැබීම් ගෙවීම් වාර්තාව

2. 2022.12.31 දිනට එකතු කල ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා

3.2022.12.31 දිනට වැය විෂයන්ගෙන් දරා ඇති වියදම් හා ඉතිරි ප්‍රතිපාදන පිළිබඳ සාරාංශය

ඉහත වාර්තා නිවැරදි බවට මහා සභාව විසින් පිළිගන්නා ලදී.

**(ඌ) වෙනත් කාරණා කිසිවක් දන්වා ඇත්නම් ඒ පිළිබඳ සාකච්ඡා කිරීම.**

**01.ගරු මන්ත්‍රීවරුන්ගේ නිවාඩු අවසරය ලබා ගැනීම**

ගරු සභාපතිතුමා විසින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.එස් හාජා මොහිදීන් මැතිතුමා,ගරු මන්ත්‍රිනි ඩී.ආර්.උදයංගනි කරුණාරත්න මැතිණිය වෙත 2023.02.15 දින ඉල්ලා ඇති නිවාඩු අවසරය ලබා දෙන ලදී.

**03. ගරු ප්‍රාදේශීය සභා සභාපති ඒ.ජී සෙනෙවිරත්න මැතිතුමා.**

සියලු දෙනාට සුබ සන්ධ්‍යාවක්.හයවෙනි සැසි වාරයේ 12 වෙනි සභා වාරයේ වැඩ කටයුතු අවසන් කිරිමට මත්තෙන් මං හිතන්නේ අපි වසර 05 ක කාල සීමාව අවසන් වී නැවතත් මැතිවරණයකට යන්න වෙන අවස්ථාවක්.අපගේ සභා කාල සීමාවේ අවසාන දින කිහිපය යන්නේ.පසුගිය කාලවලට වඩා අපි යම් කිසි දෙයක් කරා කිලා විශ්වාස කරනවා.රටේ ආර්ථික ගැටලු ,වසංගත තත්ත්වයන් සභාව පටන් ගත් කාලයේ සිටම තිබුණා ඉතා අවාසනාවන්තම මන්ත්‍රි කණ්ඩායම අපි.ඒක අපි හැම වෙලාවෙම කථා කරන්නේ අපිට කාලයක් තිබුණේ නැහැ වැඩක් කරන්න පුළුවන් කාලයකට වඩා රටේ අර්බුදකාරි අවස්ථාවන්ට තමයි මුහුණ දෙන්න සිදු වුණේ.ඒවා නොසලකා අපට කල හැකි කාර්යයන් තිබුණානම් අපි ඒ සියලු දේ කළා. ජනතාවට අසාධාරණයක් වෙන්න අපි ඉඩ දුන්නේ නැහැ.කොවිඩ් වෙලාවෙදි වුණත් අපි සියලු දෙනා එක් වී වැඩ කළා.සභාවේ සල්ලි නැහැ කියලා හිටියේ නැහැ.කොවිඩ් වෙනුවෙන් විශාල මුදලක් ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ආරක්ෂාව වෙනුවෙන් කරා.ඒ වටිනාකම ගෞරවය පින අපට තියෙනවා.මෙතෙක් කල් පැවති සභා වල මන්ත්‍රි පුතිපාදන සඳහා වෙන් කර තිබුණේ රු.25000.00 ක පමණ මුදල් ප්‍රමාණයක්.එහෙම තිබුණ සභාවේ අපි ගිය අවුරුද්දේ ඉදලා රු.100000.00 ක් දක්වා මන්ත්‍රි ප්‍රතිපාදන වෙන් කරගන්න හැකියාව ලැබුණා.මේ අර්බුදකාරි අවස්ථාවේ වුණත් අපි කඩා වැටිලා නැහැ.රටේ මොන ප්‍රශ්න තිබුණත් සභාවක් විදිහට අපි ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සේවය කළා. කියලා විශ්වාස කරනවා.ඒ ගැන සෑහිමකට පත්වෙනවා.මම වගේම ඒ සඳහා දායක වුණ ඔබ තුමාලා පිළිබඳවත් මා සතුටු වෙනවා.ඔබ සියලු දෙනාටම නැවත මැතිවරණයකට ඉදිරිපත් වී එයින් ජයග්‍රහනය ලැබ ප්‍රදේශයේ ජනතාවට සේවය කිරිමට වාසනාව ලැබෙන්න කියලා ප්‍රාර්ථනා කරන ගමන් දින කිහිපයකින් උදාවන අලුත් අවුරුද්ද ඔබ සියලු දෙනාටමත්

ප්‍රදේශයේ ජනතාවටත් සුබ නව වසරක් වේවා කියලා ප්‍රාර්ථනා කරන ගමන් අද දින සභාවට සහභාගි වූ උපසභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රිතුමන්ලාටත් කාර්යය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තුතිය පුද කරමින් සභාවේ කටයුතු අවසන් කරනවා යනුවෙන් ප්‍රකාශ කරමින් ප.ව 4.00 ට දොළොස්වන මහා සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදි.

සභාපති,

පන්විල ප්‍රාදේශීය සභාව.

**2022-12-21 දින මහා සභා වාර්තාව 2023 -01 - දින මහා සභාවේදී සංශෝධන සහිතව/රහිතව සභා සම්මත විය.**

සභාපති
පන්විල ප්‍රාදේශීය සභාව

IV.

ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු උප සභාපති එම්.ශිවකුමාර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**(ඉ) 02.IV.අදහස් ප්‍රකාශ කිරීමෙන් පසු යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ගරු සභාපතිතුමා විසින් කරන ලද යෝජනාව ගරු ප්‍රාදේශීය උප සභාපති එම්.ශිවකුමාර් මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

**(ඉ) 02.V.අදහස් ප්‍රකාශ කිරීමෙන් පසු යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

